# <u>සති පාසල සඳහා කාර්ය පත්‍රිකාව</u>

1. *පංතිය - 13
   *විෂය - ගිණුම්කරණය
   *අදාළ සතිය - දෙසැම්බර් 2

2. පාඩම හෝ ඒකකය - 13.0 අනුපාත මගින් මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා අර්ථකථනය කර කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරයි.
   නිපුණතා මට්ටම 13.4 - ලාභදායිත්ව අනුපාත ගණනය කර අර්ථකථනය කරයි.

3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්-

   1. ලාභදායිත්ව අනුපාත පිළිබඳ ව ඔබ දන්නා කරුණු මතකයට ගන්න.
   2. ලාභදායිත්ව අනුපාත ගණනය කිරීම වැදගත් වන ආකාරය විමසා බලන්න.
   3.ඊ තක්සලාව,ඊ නැණපියස,ගුරු ගෙදර,DP Education හෝ පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත්පත් ආදී ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්,පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.
   4. ලාභදායිත්ව අනුපාත වර්ග පිළිබඳව පොතපතින් කරුණු රැස් කරගන්න.
   5.දළ ලාභ අනුපාතය ගණනය කරන්නේ කෙසේදැයි වැඩිහිටියන් සමඟ සාකච්ඡා කරන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්,web site,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

   1. ඊ තක්සලාව - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/resource/view.php?id=21433

   2. ඊ නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=13795
   https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=16334

   3. ගුරු ගෙදර - නැත

4. වෙනත් - යූ ටියුබ් -
https://www.youtube.com/watch?v=hFJz5yvd2N0
https://www.youtube.com/watch?v=mTTGX4gtbyg
https://www.youtube.com/watch?v=PdmXdAvgziI

5. අතිරේක පොත්/සඟරා -

6. මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල -
    1. ලාභදායිත්ව අනුපාත පැහැදිලි කරයි.
    2. ලාභදායිත්ව අනුපාත නම් කර පැහැදිලි කරයි.
    3. දළ ලාභ අනුපාතය ගණනය කරයි.
    4. ශුද්ධ ලාභ අනුපාතය ගණනය කරයි.
    5. අනුපාත සැසඳීමෙන් තීරණ ගනියි.

7. තක්සේරුව හා ඇගයීම -

    1. ලාභදායී අනුපාත ගණනය කිරීමෙන් ව්‍යාපාරයට අත් වන වාසි කෙටියෙන් පැහැදිලි කරන්න.

    2. සීමිත කැපිටල් පොදු සමාගමේ ගිණුම් කාලච්ඡේදය 2021/03/31 දිනෙන් අවසන් වූ වර්ෂය වේ.සමාගමේ වාර්ෂික විකුණුම් රු.500,000 වන අතර දළ ලාභය විකුණුම්වලින් 40%කි.පොලිය හැර මෙහෙයුම් වියදම් රු.65,000ක් ද,පොලී වියදම රු.15,000ක් ද වේ.වර්ෂයේ ආදායම් බද්ද රු.30,000කි.මුළු වත්කම් රු.600,000ක් වන අතර,හිමිකම මුළු වත්කම්වලින් 75%කි.

       පහත සඳහන් අනුපාත ගණනය කරන්න.

       - ශුද්ධ ලාභ අනුපාතිකය
       - මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය
       - හිමිකම මත ප්‍රතිලාභ අනුපාතිකය

    3. ශුද්ධ ලාභය 30%ක මට්ටමක් කරා ළඟා කරවීමට නම්,ගත යුතු ක්‍රියාමාර්ග මොනවාදැයි යෝජනා කරන්න.

නිලධාරියාගේ නම -
පාසල/පිරිවෙන -